ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2021.05.11

ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා,
ප්‍රධානී,
කොවිඩ් 19 පැතිරීම වැලැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය,
රාජගිරිය.

<u>**කොවිඩ් 19 වසංගත රෝගී තත්වය ඇති වී ඇති පුද්ගලයෝ නිරෝධායන කටයුතු සඳහා යොමු කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධවයි.**</u>

කොවිඩ් වසංගත තත්වය තුළ ඉතාමත් අවධානම් සහගත කටයුතුවලට සම්බන්ධ වෙමින් මෙම වසංගත තත්වයෙන් ශ්‍රී ලාංකීය ජනතාව මුදා ගැනීම සඳහා ඔබ කාර්ය සාධක බලකාය මගින් සිදු කරනු ලබන කාර්යභාරය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව බෙහෙවින් අගය කරන්නෙමු.

පසුගිය අප්‍රේල් මාසයේ සිට රට තුළ වාර්තා වන රෝගීන් සංඛ්‍යාව වේගයෙන් ඉහළ යාමත් සමග ඉතාමත් කඩිනමින් රෝගී තත්වයට පත් වූවන් ඔවුන් ජීවත් වන ස්ථාන වලින් සුදුසු ආරක්ෂිත ප්‍රතිකාර මධ්‍යස්ථාන හෝ රෝහල් කරා යොමු කිරීම ඉතාමත් කඩිනමින් සිදු කිරීම අත්‍යාවශ්‍ය කරුණක් වී ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය විය. නමුත් මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක වීමේදී මතුවූ ගැටළු පිළිබඳව කොමිෂන් සභාව වෙත පැමිණිලි යොමුවී ඇති බව ඔබගේ අවධානයට යොමු කරමු. එබැවින් මෙම ක්‍රියාවලියතුළ පවතින යම් යම් කරුණු විධිමත් කර ගැනීම තුළින් වඩාත් හොඳ සේවාවක් අදාළ රෝගී ජනතාවට ලබා දීමත් රෝගී තත්වයට පත් නොවූ ජනතාව ආරක්ෂා කර ගැනීමට හේතු වනු ඇත යන්න අපගේ විශ්වාසයයි. මෙහිදී පහත කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු.

01 මේ වන විට කොවිඩ් 19 රෝගීන් ඇතුලත් කර ගන්නා රෝහල් හා ප්‍රතිකාර මධ්‍යස්ථාන මොනවාද යන්න ප්‍රසිද්ධ කිරීම

02 කොවිඩ් 19 වැළඳි රෝහලක්, ප්‍රතිකාර මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමේදී රැගෙන යායුතු අත්‍යාවශ්‍ය පුද්ගලික පරිහරණ ද්‍රව්‍ය ලැයිස්තුවක් පිළිබඳ පෙර දැනුවත් කිරීම

03 හඳුනා ගත් රෝගියකු හෝ රෝගී කණ්ඩායමක් රෝහලකට හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයකට රැගෙන යාමට පෙරාතුව සාධාරණ, ප්‍රමාණවත් සූදානම් වීමේ කාලයක් ලබා දීම

04 රෝගියා රැගෙන යන ස්ථානය පිළිබඳව රෝගියාගේ භාරකරු හෝ සමීපතයන් වෙත රෝගියා නිවසින් රැගෙන යන මොහොතේදීම කුමන ස්ථානයකට රැගෙන යන්නේද යන්න දැන්වීම සහ එහි පොදු දුරකථන අංකයක් අදාළ පුද්ගලයන්ට ලබා දීම

05 රෝගියා රැගෙන යන අවස්ථාවේදී අදාළ පුද්ගලයා නිදන්ගත රෝගී තත්වයක් හෝ දීර්ඝ කාලීන අසනීපයක් සඳහා ප්‍රතිකාර ලබන්නේ නම් ඊට අදාළ ඖෂධ රෝගියා රැගෙන යන්නේද යන්න නැවත විමසා බලන ලෙස රෝගියා රැගෙන යන කණ්ඩායමට දැනුම් දීම


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

06 රෝගියා ආබාධ සහිත නැතහොත් වයෝවෘධ තැනැත්තෙකු හෝ ළදරුවකු නම් පුද්ගලයාගේ කටයුතු කර ගෙන යාම සඳහා විකල්ප ක්‍රමවේදයක් සකස් කිරීම

07 එක් පවුලක සාමාජිකයන් කිපදෙනෙකු රෝගී වූ අවස්ථාවක හැකිතාක් එම පිරිස් එකම ස්ථානයක් ප්‍රතිකාර සඳහා යොමු කිරීමට කටයුතු කිරීම

08 ප්‍රතිකාර සඳහා යොමු කිරීමේදී හැකි සෑම විටම අදාළ පුද්ගලයාගේ ස්ථිර පදිංචියට ආසන්නම ස්ථානය තෝරා ගැනීමට හැකි උපරිමයෙන් කටයුතු කිරීම

09 කුඩා දරුවන් සිටින විට විශේෂයෙන්ම මවගෙන් වෙන් නොකිරීමට කටයුතු කිරීම

10 නිදන්ගත රෝගී තත්වයන්ගෙන් පෙළෙන පුද්ගලයෙකු ප්‍රතිකාර මධ්‍යස්ථානයේදී අදාළ රෝග සඳහා වූ ප්‍රතිකාර අඛණ්ඩව ලැබෙන බවට තහවුරු කර ගැනීම

11 විවිධ රෝගී තත්වයන් පදනම්ව ලබා දෙන ආහාර වට්ටෝරු කෙරෙහි අවධානය යොමු කර කටයුතු කිරීම

ඉහත කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කර කටයුතු කරනු ඇතැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අපේක්ෂා කරන අතර මෙමගින් කොවිඩ් 19 වසංගත තත්වය පාලනය කිරීමට ගෙනයන ක්‍රියාවලිය වඩාත් විනිවිද භාවයකින් හා ක්‍රමානුකූලව සිදුවනු ඇතැයි කොමිෂන් සභාවේ විශ්වාසයයි.

මෙම දැන්වීම කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ බලතල ප්‍රකාරව බව සලකන්න.

ආචාර්ය ජගත් බාලසූරිය
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ආචාර්ය ජගත් බාලසූරිය,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.